# 1

# එතනහාමි

ජන කතාව හා ජන කවිය යනු ලියා තැබීමකින් තොරව පරම්පරාවෙන් පරම්පරාවට ගෙන ඒමෙන් ජනයා අතර ප්‍රචලිත වූ සාහිත්‍ය නිර්මාණ යි. මිනිසාගේ දුක, වේදනාව, සතුට, විනෝදය හා බැඳුණු ජන සාහිත්‍යය අද වන විට ඒවා බිහි වූ සමාජය හා සම්බන්ධයක් නැති නූතන රසිකයන්ගේ ද රස වින්දනයට බඳුන් වෙයි. ජන කොට්ඨාසයක් සතු ඥාන සම්භාරය පරපුරකින් පරපුරකට පවරා දීමේ මාධ්‍යයක් වන ජන සාහිත්‍යය සංස්කෘතියේ කැඩපතක් සේ සැලකෙන බැවින් ඒවා බිහි වූ සමාජයේ  ජන දිවි පෙවෙත හැදෑරීමට ද වැදගත් වෙයි. පුරාණෝක්ති, මිථ්‍යා කථා, උපමා කතා, වීර කාව්‍ය ආදි වශයෙන් ජන සාහිත්‍යයේ විවිධ ප්‍රභේද වේ.



ජන කතාවක ප්‍රධාන අරමුණ කිසියම් ආප්තෝපදේශයක් හෝ උපහැරණයක් ගෙන හැර පෑම යි. මිනිස් මහිමය, තන්වැසි නුවණ හා විචක්ෂණභාවය ප්‍රකට කිරීම ජන කතාකරුවාගේ පරමාර්ථය යි. මිනිසා හා සමාජය තේරුම් ගැනීමට මේ සාහිත්‍යාංගය බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. ජන කතාවක රසය ඉස්මතු වන්නේ එහි අන්තර්ගත සරල හා රසවත් යෙදුම් නිසා ය.

ජන කතාවකට සවන් දී රස විඳීමට හා සාම්ප්‍රදායික යෙදුම් පිළිබඳ අවබෝධයක් ලැබීමට මේ පාඩම ඔබට උපකාරි වනු ඇත.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

කටගාය හැදෙනවා කියලා ලෙඩක් තියෙනවා ගම්වල. ඒක හැදුණ ම මිරිස් කියලා ජාතියක් කන්න බැහැ. කිරි හොදි හරි පොල් හරි එක්ක තමයි බත් කන්න වෙන්නේ.

එක ගමක එතනහාමි කියලා ගෑනියෙක් හිටියා. ඒ ගමෙත් එක කාලෙක කටගාය කියන ලෙඩේ හැදුණා. ඉතින් උන්දැ මොක ද කළේ, කිරි හොද්දක් හදලා බත් උයලා තියලා නාන්න ඕන කියලා වත්ත පහළ ළිඳට ගියා. යන අතරමග දි උන්දැ දැක්කා හේනේ ඉඳලා දෙවැට දිගේ ගෙදර එන එයාගෙ මනුස්සයා ඩිංගිරාල.

'මේ ඇහුණ ද... බත් උයලා ඇති...

බෙදා ගෙන කාපල්ලා.'

කියාගෙන එතනහාමි නාන්න ගියා.

මේ උන්දැත් ගෙදර ඇවිත් බත් කන්න ඕනෙ කියලා හිතා ගෙන කුස්සියට ගියා. මඩක්කුවෙ කිරි හොදිත් තියෙනවා දැක්කා. මිනිහටත් කටගාය හැදිලා තිබුණෙ. මිනිහට හරි බඩගිනි යි. මුට්ටියෙන් බත් බෙදා ගෙන අර හොදි ටිකකුත් දමා ගෙන බඩපුරා ම ඩිංගිරාල බත් කෑවා.

ටික වේලාවකින් එතනහාමි නාගෙන ගෙදර ආවා. 'ඈ බන් යෝදියෙ, මොක ද උඹට වෙනදට අර වගේ රස හොද්දක් හදන්න බැරි. අද නම් බඩ පිරෙන්න ම බත් කෑවා.' කියලා ඩිංගිරාල කියාපි. කියලා ගිහින් වැල් ඇඳේ දිගෑදුණා. එතනහාමිටත් එයා හදපු කෑමවල උජාරුව කීවම හීන් සතුටක් හිතේ ඇඳුණා. ඈත් බත් කන්න ගිහිං වළං වහුන් ඇරලා බැලුවා.

'මේ ඇත්තට ම ඔහේ බත් කෑවේ මොනව එක්ක ද?

මේ හොදි හට්ටිය වහුන් ඇරලවත් නැහැනේ' කියලා එතනහාමි පුදුමෙන් කිව්වා.

'ඇයි ඔය මඩක්කුවෙ උඹල තියාපු හොදිවලින් මං ගත්තෙ' ඩිංගිරාල ගණනකට නැතිව කීවා.

'දෙයියනේ... මොනව ද මේ කාලා තියෙන්නේ. මඩක්කුවෙ තිබුණෙ මං හාල් හෝදපු වතුර ටික නේ' කියලා එතනහාමි  කෑගැහුවා.

ඩිංගිරාලට හීන් දාඩිය දාගෙන එනවා වාගේ දැනුණා. මදැයි ගෑනිගෙ ඉවුම් පිහුම් අගේ කරන්න ගිහින් වෙච්ච දේ.

ඔහොම අකරතැබ්බ මේ දෙන්න දෙමාල්ලන්ට හිටපු ගමන් වෙනවා. එතනහාමිට එයාගේ අම්මගෙන් ලැබුණ හවරියක් තිබුණා. කොහේ හරි වැදගත් ගමනක් යන කොට ඒ හවරිය දාලා ලොකු කොණ්ඩයක් බැඳගෙන මහ උජාරුවට යන හැටි බලන්න ඕනෙ!



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ඔන්න දවසක් ගෙදර හරි ම කලබලේ. එතනහාමිගෙ හවරිය නැති වෙලා. ගේ පුරා ම හෙව්වා බැලුවා. නෑ හම්බ වුණේ. හරිම හිතට අමාරු යි එතනහාමිට. සාස්තරයක්වත් අහලා බලන්න ඕනේ කියලා හිතා ගත්තා.

'ඔහේ මොක ද කියන්නේ... අපි දෙන්න යමු ද සාස්තරයක් වත් අහන්න' හාමිනේ කියනවා. ඩිංගිරාල වැඩිය ඔය සාස්තර ගුරුකම්වලට කැමති මිනිහෙක් නෙමෙයි. ඒත් එතනහාමිගෙන් ගැලවිලා ඉන්න පුළුවනෑ.

'හා හොඳයි යමල්ලා' කියලා ඩිංගිරාලත් ලෑස්ති වුණා ගමනට. බොහොම වෙහෙස වෙලා දෙන්නත් එක්ක සාස්තර කියන තැනට ආවා. සාස්තරකාරය මායම් වෙලා සාස්තරේ කියනවා,

'මේ ඇවිල්ල ඉන්නේ නැති වුණ දෙයක් ගැන අහන්න යි.

හරි ද?'

'හරි' එතනහාමි වැඳ ගෙන කියනවා.

'මේකේ හැඬේ දිගටියටත් තියෙනවා රවුමටත් තියෙනවා.

මේක කාටත් පොරෝජන වෙන දෙයක් හරි ද?'

'හරි හරි' කියලා එතනහාමි ඩිංගිරාලගේ කනට කොඳුරනවා.

'ඔන්න සාස්තරේ හරියට කියවීගෙන එනවා නේ ද?

'මේක හරි බර සාර හින්ද දෙන්නෙක් එක්ක මාරුවෙන් මාරුවට කර ගහ ගෙන ගෙනිහින් තියෙනවා. ගෝනියක දමලා.'

එතනහාමි කේන්තියෙන් එක පාරට ම නැඟිට්ටා.

'ඈ බොලන්, හවරිය කොහොම ද බර සාර දෙයක් වුණේ. යමල්ලා යන්න මේ බොරු සාස්තරවලට රැවටෙන්නේ නැතිව.' කේන්තියෙන් පුපුර පුපුර එතනහාමි ගස්සගෙන ඉස්සර වුණා.

'උඹේ මේ කෙහෙම්මල් හවරිය හින්දා මගේ හේනේ කුඹුරේ වැඩත් පාළු වුණා.' ඩිංගිරාලත් තරහෙන් මූණ දික් කර ගෙන ගෙදර ආවා.

වෙලා තියෙන්නේ මොකක් ද දන්නව ද? මේ සාස්තරකාරයා ගමේ ඔත්තුකාරයෙක් දාලා තියෙනවා. එයා ඕපදූප සොයාගෙන ඇවිත් නැති වුණ දේවල් ගැන කියනවා. ඉස්සරින්දා රෑ කොටුවක අල හොරු ගෙනිහින් තිබුණා. ඉතින් සාස්තරකාරයත් වැරදිලා මේ ජෝඩුව ආවේ ඒක ගැන අහන්න කියලා හිතලයි, සාස්තරේ අරහෙම කියලා තිබුණේ!

## අවබෝධය

1. ගමෙහි පැතිර ගිය රෝගය කුමක් ද? එහි රෝග ලක්ෂණය කුමක් ද?
2. නාන්න යන එතනහාමිට ඩිංගිරාල මුණ ගැසුණේ කොහේ දී ද?
3. ඩිංගිරාලට සිදු වූ වැරදීම එතනහාමි දැන ගත්තේ කෙසේ ද?
4. සාස්තරයක් අසා දැන ගැනීමට අවශ්‍ය වූයේ කුමක් ගැන ද?
5. සාස්තරකාරයාට වැරදීමක් සිදු වූයේ ඇයි?

## ලිඛිත අභ්‍යාස

1. පහත සඳහන් ප්‍රකාශ කා විසින් කා හට කුමන අවස්ථාවක දී කියන ලද ද?

   i. "බත් උයලා ඇති....... බෙදාගෙන කාපල්ලා"
   ii. "මොනව ද මේ කාලා තියෙන්නේ?"
   iii. "ඔන්න සාස්තරේ හරියට ම කියවීගෙන එනවා නේද"
   iv. "උඹේ මේ කෙහෙල්මල් හවරිය හින්දා මගේ හේනෙ කුඹුරෙ වැඩත් පාළු වුණා"

2. පහත සඳහන් ප්‍රස්තාව පිරුළු අදාළ කර ගත හැකි වන ලෙස කතන්දර නිර්මාණය කරන්න.

   i. ගඟට ඉනි කැපුවා වාගේ.
   ii. තැළෙන යකඩෙ දැක්කම ආචාරියා උඩ පැන පැන තළනවලු.
   iii. තටු හැළුණු පක්ෂියා වගෙයි.
   iv. ආරේ ගුණ නැරේ.

3. පහත සඳහන් විස්තර ඇසුරින් කතා නිර්මාණය කරන්න.

   (අ) i. ගමරාල සහ ගම හාමිනේ හේනට යති.
   ii. වට්ටක්කා වැලෙහි විශාල ගෙඩියකි.
   iii. ගෙදර ගෙනැවිත් ඔවුහු එය දෙකට කපති.
   iv. වට්ටක්කා ගෙඩිය තුළින් දිලිසෙන මැණිකක් මතු වෙයි.
   v. මැණික් ගල අතට ගත් සැණින් මතු වූ රුවකි.
   vi. ගම යුවළ වරයක් ඉල්ලති.
   vii. වරය ලැබෙයි. පැවතීම ටික කලකි.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

(ආ) i. ගුහාවක සිංහයෙකි.
ii. ඒ අසල මීයෙකි.
iii. ගුහාව සමීපයේ සැඟවී සිටින නරියෙකි.
iv. සිංහයා නින්දට වැටෙයි.
v. මීයා සිංහයාගේ හිස දෙසට වැටී ඇති ලෝම කපයි.
vi. නරියා සිංහ වෙස් ගනී.
vii. නරියා සිංහ ගුහාවට පිවිසෙයි.
viii. සිංහ ගුහාව දෙසට විශාල නාගයෙක් ඇදී එයි.
ix. සිංහ වෙස් ගත් නරියා බිය වී කෑගසයි.
x. ඒ හඬින් සිංහයා අවදි වෙයි.

## ප්‍රායෝගික අභ්‍යාස

1. විවිධ වර්ගයේ ජන කතා රැස් කර පොතක් නිර්මාණය කරන්න.
2. ජන කතා කියවා එවායින් දෙන පණිවිඩය හා උපදේශය පුවරුවක ලියා පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
3. ප්‍රස්තාව පිරුළුවලට අදාළ කතා ගොනු කර පොතක් සකස් කරන්න.

# සාම්ප්‍රදායික යෙදුම්

**අත හයිය නම් බත නොවරදින** බව හොඳින් ම දන්නා කිරිබණ්ඩා තනිව ම **දුක් මහන්සි වී හේනක් කුඹුරක්** අස්වද්දන්නට පටන් ගත්තේ ය. ඔහුගේ පියා ද මේ වගේ ම **සිතා මතා** වැඩ කළ **හයිහත්තිය** ඇති ගොවියෙකි. **කල් යල්** බලා වගාවට **සැප සාත්තු** කිරීමේ ප්‍රතිඵලය වූයේ **සරු සාර** අස්වැන්නයි. කිරි බණ්ඩාගේ **ඉහේ මලක් පිපුණි.** **දවසට දෙකට හැදුණු** වැඩුණු කෙසෙල් කොටුවේ ලොකු කෙසෙල් කැන් තුනක් ම හොඳට පැහී තිබෙනු දුටු කිරිබණ්ඩා ඒවා විකුණන්නට තීරණය කළේ ය. **හිමිදිරි පාන්දර** ම හේනට ගිය ඔහු **වෙඩි කෑ ඌරකු** මෙන් හැසිරෙන්නට වූයේ කෙසෙල් කැන් තුන අතුරුදන් වී ඇති බව දැකීමෙනි.

**ලහි ලහියේ** කඩමණ්ඩියට දිව ගිය ඔහු හීන් මලයාගේ තේ කඩයට ගොඩ විය. එහි සිටි සේතුහාමි වට පිට බලමින් **හොර ගල් අහුලන්නට** විය. සේතුහාමි ගැන සැක සිතූ කිරිබණ්ඩා වහ වහා කඩය තුළට ගියේ එහි **අහු මුලු** පරීක්ෂා කරන්නට ය. මුල්ලක තබා තිබුණු කෙසෙල් කැන් දුටු කිරිබණ්ඩාට **යකා නැග්ගේ ය.** කෙසෙල් කැන් කඩයට ගෙනාවේ කවුරුන් දැයි දැන ගත් ඔහු මෙතෙක් **දිවෙන් දිව ගා ගෙන** සිටි සේතුහාමි අල්ලා ගෙන **දෙහි කපන්නට** පටන් ගත්තේ ය.

**ඇත්තක් කියා පැත්තක් ගියත් කමක් නැතැයි** සිතූ සේතුහාමි තමා අතින් සිදු වූ වරද ගැන පාපෝච්චාරණය කළේ ය. කිරිබණ්ඩාගේ කේන්තිය **අකා මකා** ගියේ ය. **"උඹ කන්න දීපු අත හපා කෑවා එහෙනම්."**

ඉහත සඳහන් සිද්ධිය ඉදිරිපත් කිරීමේ දී යොදා ගෙන ඇති භාෂාව ගැන විමසිලිමත් වන්න. කිසියම් ප්‍රකාශයක් රසවත්ව ඉදිරිපත් කරන්නට ඕනෑ ම භාෂාවක් සතුව පවතින සම්ප්‍රදායක් වෙයි. සාහිත්‍ය නිර්මාණයක දී ද ලේඛනයේ දී ද එදිනෙදා කථා ව්‍යවහාරයේ දී මෙවැනි යෙදුම් දැකිය හැකි ය. ජන සාහිත්‍යයේ බෙහෙවින් දැකිය හැකි, භාෂාවකට උරුම වූ මෙවැනි යෙදුම්, සාම්ප්‍රදායික යෙදුම් ලෙස හැඳින්වේ. මේ අතර,

1. රූඪී (ඉඟි වැකි)
2. ප්‍රස්තාව පිරුළු
3. යුගල පද

යනුවෙන් වර්ග කිහිපයකි.

ඉහත සඳහන් පාඨයේ **"ඉහේ මලක් පිපුණි"**, "යකා නැග්ගේ ය", වැනි යෙදුම්වල අර්ථය ඒවායේ යෙදී ඇති වචනවලින් කියැවෙන අර්ථය ඉක්මවා යන වෙනස් ම අර්ථයකි. මේවායේ අර්ථය ඉඟියෙන් ගත යුතු නිසා **'ඉඟි වැකි'** ලෙස ද හැඳින්වේ. රූඩී හෙවත් 'ඉඟි වැකි' යනුවෙන් හැඳින්වෙන මෙවැනි යෙදුම් භාෂාව රසවත් කරන්නට සිංහල අපට උරුම වූවකි.

'දුක් මහන්සි' 'හරි බරි'

'සිතා මතා' 'හයි හත්තිය'
'කල් යල්' 'සැප සාත්තු'

'සරු සාර' 'දවසට දෙකට'
'හැදුණු වැඩුණු' 'හිමිදිරි පාන්දර'

මේ යෙදුම්වල තනි පදයක් පමණක් යෙදුවොත් එහි රසයක් නැත. පද යුගලය ම එකට යෙදෙන විට එහි අරුත වඩාත් දැනෙන්නට වෙයි. මේවා **'යුගල පද'** ලෙස හැඳින්වෙන්නේ ද පද යුගලය ම එකට භාවිත කළ යුතු බැවිනි. මේ යෙදුම් මගින් ප්‍රකාශයක අර්ථය අලංකාර වෙයි; රසවත් වෙයි.

"අත හයිය නම් බත නොවරදින්නා වගේ"

"වෙඩි කෑ ඌරෙකු වගේ"

"ඇත්තක් කියා පැත්තක් ගියත් කමක් නෑ"

"කන්න දීපු අත හපා කනවා වගේ"

ප්‍රස්තාවකට හෙවත් අවස්ථාවකට ගැළපෙන කියමන ප්‍රස්තාව පිරුළකි. තැනට ගැළපෙන කියමනක් ලෙස හැඳින්විය හැකි ප්‍රස්තාව පිරුළු බිහි වූයේ ගැමි වහරිනි. ගැඹුරු අර්ථයක් සරලව ප්‍රකාශ කිරීම එහි ජීව ගුණය යි. උපදේශය, උපහාසය, හාස්‍යය යන ගුණාංග ප්‍රස්තාව පිරුළුවල දැකිය හැකි ය. කතන්දර ඇසුරෙන් නිර්මාණය වුණු ප්‍රස්තාව පිරුළු ද වෙයි. යුගල පද, රූඩී හා ප්‍රස්තාව පිරුළු ආදී සාම්ප්‍රදායික යෙදුම් මගින් සිදු වන්නේ අපේ භාෂාව රසවත් වීම යි.

## ලිඛිත අභ්‍යාස

1. දී ඇති පාඨය ඇසුරෙන් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| රූඪී | යුගල පද | ප්‍රස්තාව පිරුළු |
|---|---|---|
| | | |
| | | |
| | | |

2. 'අ' තීරුවට ගැළපෙන අදහස 'ආ' තීරුවෙන් තෝරා ලියන්න.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| ඇඟිලි ගනිමින් හිටියා | බලය පිරිහී |
| අමු කැවිලා | නිෂ්ඵල ක්‍රියාවක යෙදීම |
| කිඹුල් කඳුළු හෙළීම | බොරු කියමින් මවා පෑම |
| අන්තිම ඉත්තත් ඇදීම | බොරු සෙනෙහසක් පෙන්වීම |
| පොරකටු ගෙවිලා | දරුවකුගේ අකීකරුකම |
| කුකුළු නින්ද | එකට එක කිරීම |
| කුනිස්සන්ට දැල් දානවා | වැරදි අවබෝධයකින් සිටීම |
| එකා යකා වෙලා | සතුටින් හා අපේක්ෂාවෙන් සිටියා |
| බක තපස් රැකීම | අවසාන උත්සාහයක් ගැනීම |
| කැත්තට පොල්ල වගෙයි | ස්වල්ප වෙලාවක නින්ද |

3. එක් එක් තීරුවෙහි දී ඇති උදාහරණයට අනුව සුදුසු යුගල පද යොදා පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| සුව - පහසුව | ඇත - මෑත | ලට - පට | රොඩු - බොඩු | කවා - පොවා |
|---|---|---|---|---|
| | | | | |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

4. **හිස්තැන් පුරවන්න.**

| | | | |
|---|---|---|---|
| i. | ඇද............. | vi. | ............. පීඩන |
| ii. | ඇදහිලි ................ | vii. | ................ කුඩුම |
| iii. | ළමයි ................ | viii. | ................. බුද්ද |
| iv. | කුඩු ..................... | ix. | ................ මාන්න |
| v. | රැවුම් ................... | x. | ............දොඩා |

5. **පහත සඳහන් ප්‍රස්තාව පිරුළු ඔබේ අදහසට අනුව වර්ග කරන්න.**

- ගලේ කෙටූ අකුර වගේ
- හොරාගේ අම්මාගෙන් පේන ඇහුවා වගේ
- උරුලෑවා ගිය පාර වගේ
- ආරේ ගුණ නෑරේ
- ඉබ්බා කට හින්දා නැහුණා වගේ
- අඟේ ඉඳන් කන කනවා වගේ
- අබරා සිල්ගත්තා වගේ
- පාළු ගෙයි වළං බිඳිනවා වගේ
- කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ
- යුද්දෙට නැති කඩුව කොස් කොටන්න ද?
- තැනේ හැටියට ඇණේ
- දේසේ හැටියට බාසේ
- සුබ නම් දොරටු පාලකයාට ඔටුනු පැලැන්දුවා වගේ
- අල්ලපු අත්තත් නෑ පය ගහපු අත්තත් නෑ
- බල්ලෙක් බිරුවාට කන්දක් මිටි වේ ද?
- අනේ කාලේ වනේ වාසේ
- කළ කළ දේ පල පල දේ
- ජාඩියට මූඩිය වගේ
- කොරේ පිටට මරේ

6. **පහත සඳහන් පිරුළු අදාළ කර ගත හැක්කේ කෙබඳු අවස්ථාවක් විස්තර කිරීමට දැයි පැහැදිලි කරන්න.**

උදාහරණය: අල්ලපු අත්තත් නෑ පය ගහපු අත්තත් නෑ
යම් තේරීමක දී දෙපැත්තට ම ආශාවෙන් කටයුතු කිරීමට යෑමෙන් දෙපැත්ත ම අහිමි වීම.

i. නයාට අඳුකොළ වගේ.

.......................................................................................................................................

ii. උපාසක බළල්ලු මීයෝ දෙන්නා දෙන්නා අල්ලනවාලු.

.......................................................................................................................

iii. එකට කෑවට බොක්ක වෙනස්ලු.

.......................................................................................................................

iv. එළිපත්තේ ඉන්න බළලා වගෙයි.

.......................................................................................................................

v. ඇටි කෙහෙල් කාපු උගුඩුවා වගෙයි.

.......................................................................................................................

7. **පහත සඳහන් කතාව කියවා ඊට ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.**

පහත සඳහන් වන්නේ එක් ප්‍රස්තාව පිරුළකට අදාළ ජන කතාවකි. මෙවැනි කතන්දර කියවා රස විඳින්න.

එක දවසක් එක ගමරාල කෙනෙක් ලී කැපීම සඳහා වනාන්තරයට ගියේ ය. එහෙත් ඔහුට ආපසු එන විට පාර වැරදුණි. මෙහෙම අතරමං වී සිටිද්දී නරිහාමි කෙනෙකු ඔහුට මුණ ගැසුණි. "අනේ! නරිහාමි මට ගෙදරට යන්න පාර පෙන්වන්න. මම හොඳ තෑග්ගක් දෙන්නම්. මගේ හොඳ කුකුළු නාම්බො දෙන්නෙක් ම දෙන්නම්."

"හා හොඳයි මම ගමරාලව ගෙදරට ඇරලවන්නම්. එන්න මාත් එක්ක."

තෑග්ගක් දෙන පොරොන්දුව පිට ගමරාල ගෙදරට ඇරලවූ නරිහාමි තෑග්ග ලැබෙන තුරු ගඟ අද්දරට වී බලා සිටියේ ය. කළගුණ නොදන්නා ගමරාල නරිහාමිට හොඳ වැඩක් කරන්නට සිතුවේ ය.

'දෙනවා මම උන්දැට කුකුළෝ' යි සිතූ ගමරාල, ගෝනියකට ගෙදර සිටි බල්ලා දමා එහි කට හොඳින් බැන්දේ ය. ගඟ අද්දරට ගිය ඔහු මේ තෑග්ග නරිහාමිට දුන්නේ ය.
"බොහොම ස්තුතියි ගමරාල." කියා ඉතා සතුටින් තෑග්ග රැගෙන කැලයට ගිය නරිහාමි ගෝනිය ලිහා ගත්තා පමණි. ගෝනියේ සිර වී සිටි බල්ලා එළියට පැන්නේ ය. නරිහාමි පණ එපා කියමින් දුවන්නට විය. වනන්තරේ ගාලක ජීවත් වන නරිහාමිගේ බිරිඳ පසු නො බලා දුවන තම ස්වාමියා දෙස බලා සිටියා ය.

"මොක ද මේ දුවන්නේ?"
"අනේ හාමිනේ කළ හොඳ පස්සෙන් එළවනවා" කියමින් නරිහාමි නරිගාලට පැන ගත්තේ ය.